MODULE 1

# ඩිජිටල් අයිතිවාසිකම් සහ වගකීම්

පළමු ප්‍රකාශනය 2020 මාර්තු

ප්‍රකාශනය :
ශ්‍රී ලංකාජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානය**(NCEASL)**

වෙබ් අඩවියට **www.minormatters.org**

සංස්කාරකට නාලක ගුණවර්ධන

ව්‍යාපෘති සම්බන්ධීකරණය:

යමිනිරවින්ද්‍රන්,අධ්‍යක්ෂ -නීති සහ උපදේශන ෂලෝම් ඩැනියෙල්, නීති සහ උපදේශනසම්බන්ධීකාරක, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභාඅක්ෂිණපළිහවඩන, මාධ්‍ය මූලෝපාය නිලධාරී, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභා

පිට කවර නිර්මාණය: සංජයන් අරියදුරෙ

පිටු පිරිසැලසුම සහ නිර්මාණය: ෂෙනල් ජෙසුඩියන්

Commons Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) license
බලපත්‍රය යටතේ මෙය භාවිතා කළ හැක.
http://creativecommons.org/licenses/by-sa/3.0/igo/

වියාචනය:

මෙම ප්‍රකාශනයේ අන්තර්ගත විශ්ලේෂණයන් අදහස් දායකයින්ගේ සහ සංස්කාරකවරුන්ගේ අදහස් වේ. ඔවුන් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයේ සාමාජිකයන් නොවන අතර සංවිධානය නියෝජනය නොකරයි.

# ඩිජිටල් අයිතිවාසිකම් සහ වගකීම්

අපි අපගේ ජීවිතයේදී වැඩි වැඩියෙන් අන්තර්ජාලය හා සම්බන්ධ වන්නෙමු. ඉගෙනීම, වැඩ කිරීම, සමාජය සමග සම්බන්ධ වීම, ප්‍රජාවන් බලමුළුගැන්වීම, භාණ්ඩ මිළ දී ගැනීම ආදී කටයුතුවලදී අපි එසේ අන්තර්ජාලය භාවිතා කරන්නෙමු. එම නිසා අපගේ ඩිජිටල් හිමිකම්වල වැදගත්කම දිනෙන් දින වැඩි වෙමින් තිබේ.

තමන් කැමති පරිදි විවිධ වර්ගවල ඩිජිටල් තාක්ෂණය සහ සේවා භාවිතා කිරීමේ අයිතිය සැමටම තිබේ. එහෙත්, එම භාවිතය සිදු කළ යුත්තේ වගකීමකින් යුතුව සහ ආචාරධාර්මිකව ය.

ඩිජිටල් තාක්ෂණය වනාහි දෙපැත්ත කැපෙන කඩුවක් වැනි ය. එයින් අදහස් වන්නේ එය හොඳට මෙන් ම නරකට ද භාවිතා කළ හැකි බවයි. එය භාවිතා කරන්නේ කවුරුන් විසින් කුමන අරමුණක් වෙනුවෙන් ද යන කාරණය මත එමගින් මානව හිමිකම් ප්‍රවර්ධනය, භාවිතා කිරීම මෙන් ම උල්ලංඝනය ද සිදු විය හැකි ය.

ඩිජිටල් තාක්ෂණය භාවිතා කරන සියලු දෙනා මෙම යථාර්ථය තේරුම් ගත යුතු ය. අප හට ඩිජිටල් වාසි උපරිම කරගත හැක්කේ සහ අසාර්ථකභාවයන් වළක්වා ගත හැක්කේ දැනුවත්භාවය හා පරිස්සම මගිනි.

නිදසුනක් ලෙස, ඩිජිටල් මෙවලම් විසින් දත්ත රැස්කිරීම, සැකසීම සහ බෙදාගැනීම අන් කවරදාටත් වඩා පහසු කරනු ලැබේ. අපගේ දත්ත රජයන් හෝ ෆේස්බුක්, ගූගල් වැනි අන්තර්ජාල සමාගම් විසින් භාවිතා කරනු ලබන්නේ කෙසේදැයි අප දන්නවා ද? අපගේ දත්ත සාධාරණ හා පරිස්සම් සහගත ලෙස පරිහරණය වෙනවා ද? අපගේ දැනුවත්භාවයෙන් හා කැමැත්තෙන් තොරව ඒවා බෙදාහරිනවා ද? විකුණනවා ද? රජයන් අපගේ පෞද්ගලික ඊමේල් හා වෙනත් සන්නිවේදන පරීක්ෂාවට ලක් කරනවා ද?

බොහෝ රටවල විවිධ නීති, රෙගුලාසි සහ තාක්ෂණික ආරක්ෂණ ක්‍රම තිබුණ ද, රජයන්ට හා සමාගම්වලට පමණක් නොව සයිබර් අපරාධකරුවන්ට ද අපගේ ඇතැම් දත්ත ලබාගැනීමට හා අපගේ අන්තර්ජාල ක්‍රියා සහ සන්නිවේදනයන් නිරීක්ෂණය කිරීමට පුළුවන. ඩිජිටල් සහ වෙබ් සේවා භාවිතා කරන්නන් ලෙස අප ඩිජිටල් හිමිකම් මෙන් ම ඒවා උල්ලංඝනය විය හැකි ආකාරය පිළිබඳව ද වැඩි දැනුවත්භාවයක් ලබාගත යුතු ය.

එසේම අප අපගේ දත්ත සහ වෙනත් ඩිජිටල් දේපල යම් ආරක්ෂක ක්‍රියාමාර්ග ඔස්සේ ආරක්ෂා කරගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ දැනුවත් විය යුතු ය. ඒ අතරතුර ම, අප ද අනෙක් අයගේ ඩිජිටල් හිමිකම් උල්ලංඝනය නොකළ යුතු ය. වෙනත් අය ඩිජිටල් අවදානම්වලට ලක් නොකළ යුතු ය.

ඩිජිටල් හිමිකම් හා ඩිජිටල් වගකීම් සංකල්ප පිළිබඳ අපි මෙම මොඩියුලයෙහිදී අධ්‍යයනය කරන්නෙමු. ඊළඟ මොඩියුල විසින් ඩිජිටල් සන්නිවේදනයේ සහ ඩිජිටල් ආරක්ෂාවේ මූලිකාංග පිළිබඳ ඔබට හඳුන්වා දෙනු ඇත.

# ප්‍රධාන යෙදුම්

ඩිජිටල් හිමිකම් යන යෙදුමෙහි විවිධ පුද්ගලයන්ට විවිධ අරුත් තිබිය හැකි ය. ඒ අතර ඩිජිටල් පිටපත් අයිතියෙහි සිට ඩිජිටල් මානව හිමිකම් දක්වා අරුත් තිබේ.

ඩිජිටල් මානව හිමිකම් බොහෝ විට සරලව ඩිජිටල් හිමිකම් ලෙස හැඳින්වේ. පුද්ගලයන්ට ඩිජිටල් මාධ්‍ය වෙත පිවිසීමට, භාවිතා කිරීමට, නිර්මාණය කිරීමට සහ ප්‍රසිද්ධ කිරීමට හෝ පරිගණක, වෙනත් ඉලෙක්ට්‍රොනික් උපාංග හෝ සන්නිවේදන ජාලයන් වෙත පිවිසීමට හෝ භාවිතා කිරීමට හෝ තිබෙන අයිතිය එසේ හැඳින්වේ.

ඩිජිටල් පිටපත් අයිතිය අනුසාරයෙන් සලකා බැලූ විට ඩිජිටල් හිමිකම් යනු, පිටපත් හිමිකම තහවුරු කරන ලද ඩිජිටල් කාර්යයන් (චිත්‍රපට, සංගීතය හා කලා වැනි) සහ පරිගණක, ජාල සහ ඉලෙක්ට්‍රොනික් උපාංගවලට අදාළව භාවිතා කිරීමේ අවසරයන් සහ හිමිකම් අතර සම්බන්ධතාවයි. ඩිජිටල් හිමිකම් මගින් ඩිජිටල් තොරතුරු වෙත ප්‍රවේශය සහ පාලනය ද අදහස් කෙරේ.)

ඩිජිටල් හිමිකම් කළමනාකරණය යන්නෙන් අදහස් කරනු ලබන්නේ, ඩිජිටල් ආකාරයට ගබඩා කරන ලද මාධ්‍යවල පිටපත් හිමිකම ආරක්ෂා කිරීමට තිබෙන පද්ධති රැසකට ය. ඒවා අතරට, ඩිජිටල් සංගීතය සහ චිත්‍රපට මෙන් ම ඩිජිටල් වශයෙන් ගබඩා කරනු ලබන හා හුවමාරු කරන වෙනත් දත්ත ද අයත් වේ.

මෙම ලේඛනයේදී ඩිජිටල් හිමිකම් යන්නෙන් අප අදහස් කරන්නේ ඩිජිටල් මානව හිමිකම් මිස ඩිජිටල් පිටපත් හිමිකම නොවේ.



Source: http://www.ictliteracy.info/

# මානව හිමිකම් සහ ඩිජිටල් හිමිකම්

සියලු ඩිජිටල් හිමිකම්වල මුල වන්නේ මූලික මානව හිමිකම් පිළිබඳ ගෝලීය රාමුවයි. එය විවිධ සමාජය සහ සංස්කෘති තුළ ඓතිහාසිකව විකාශය වී තිබේ.

මානව හිමිකම් යනු සියලු මානවයන්ට ලිංගිකත්වය, ජාතිය, ජනවර්ගය, භාෂාව ආගම හෝ වෙනත් සාධක මත පදනම් නොවී මානවයෙක් වීම නිසාම හිමිවන අයිතිවාසිකම් වේ. ජීවත් වීමේ හිමිකම, වහල්භාවයෙන් සහ වධහිංසනයෙන් තොර වීමේ නිදහස, අදහස් දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහස, වැඩ කිරීමට හා අධ්‍යාපනයට අයිතිය සහ තවත් බොහෝ දේ මානව හිමිකම්වලට අයත් වේ. කිසිදු වෙනස්කමකින් තොරව සියලු මනුෂ්‍යයින්ට මෙම අයිතිවාසිකම් හිමි වේ.

මෙම හිමිකම් අන්තර්ගත වන ඉතා වැදගත් ලේඛනය වන්නේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශයයි. ලොව සියලු කලාපවල විවිධ නීතිමය හා සංස්කෘතික පසුබිම්වලින් පැවත එන නියෝජිතයන් විසින් කෙටුම්පත් කරන ලද එය 1948 දෙසැම්බර් 10දා පැරිස් නුවරදී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේදී ලෝකවාසී සියලු ජනතාව සහ ජාතීන් විසින් සාක්ෂාත් කරගත යුතු පොදු ප්‍රමිතියක් ලෙස සම්මත කරගන්නා ලදී. විශ්ව මානව හිමිකම් ප්‍රකාශය මගින් විශ්වීය වශයෙන් රැකගත යුතු මූලික මානව හිමිකම් 30ක් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රකාශනයේ නිදහස, වධහිංසනයෙන් නිදහස, පෞද්ගලිකත්වයේ අයිතිය සහ අධ්‍යාපනයේ අයිතිය ඒ අතරට අයත් වේ. විශ්ව මානව හිමිකම් ප්‍රකාශය ලොව පුරා භාෂා 500කට පරිවර්තනය කර තිබේ.

මෙම හිමිකම් ආරක්ෂා කිරීම කරනු ලබන්නේ 1945 සිට සම්මත කරගන්නා ලද ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් සහ වෙනත් නීතිමය ලේඛන මාලාවක් මගිනි. ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යනු ඒවායේ සමස්ථ එකතුවයි. ලොව බොහෝ රටවල් (ශ්‍රී ලංකාව ඇතුළු) මෙම ගිවිසුම්වලට අත්සන් කර ඒවා ක්‍රියාත්මක කර තිබේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) යනු මානව හිමිකම් ලොව පුරා ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමේ කාර්යභාරය පැවරුණු එක්සත් ජාතීන්ගේ ආයතනයයි. ස්විට්සර්ලන්තයේ ජිනීවාහි මූලස්ථානය පිහිටි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වසරකට තුන් වරක්, මාර්තු, ජූනි සහ සැප්තැම්බර්වලදී ස්ථාවර රැස්වීම් පවත්වයි.

මෑත වසරවලදී, ඇතැම් මානව හිමිකම් විශේෂයෙන් ම සයිබර් අවකාශයට අදාළ බව හඳුනාගෙන තිබේ. මේවා අතරට, ප්‍රකාශනයේ නිදහස, දත්ත ආරක්ෂා කිරීමේ සහ පෞද්ගලිකත්වයේ අයිතිය සහ සංවිධානය වීමේ අයිතිය අයත් වේ. වැඩිදුරටත්, අධ්‍යාපනයට සහ බහු භාෂා භාවිතයට ඇති අයිතිය, පාරිභෝගික හිමිකම් සහ සංවර්ධනය වීමට ඇති අයිතිය පුළුල් කිරීම ද ඩිජිටල් වශයෙන් වැදගත් යයි සැලකේ.

හැමවිට ම වර්ධනය වෙමින් තිබෙන සයිබර් අවකාශයේ දත්ත උත්පාදනය සහ ප්‍රබල ඇල්ගොරිදම් මත පදනම් වූ තාක්ෂණයන් හේතුවෙන් පුද්ගල පෞද්ගලිකත්වයට මෙන් ම වෙනත් මානව හිමිකම්වලට ද බරපතල අවදානමක් ඇති කරයි. අන්තර්ජාලයේ දේශසීමා අතික්‍රමණය කරන ස්වභාවය විසින් ම පවත්නා නීති සහ ආයතනික රාමු අභියෝගයට ලක් කරනු ලැබේ.

මෙම නව යථාර්ථයන්, පවත්නා මානව හිමිකම් රාමු හා යාකිරීම ලෙහෙසි නැත. සයිබර් අවකාශයේ ඩිජිටල් රාජ්‍යය වෙනුවෙන් අමතර හිමිකම් තිබිය යුතුදැයි ඇතැමෙක් අසති.

2016 ජුනි මස, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඇති කරගන්නා ලදී. "අන්තර්ජාලයෙන් බැහැරදී මිනිසුන්ට තිබෙන හිමිකම් අන්තර්ජාලයේදී ද ආරක්ෂා කරගත යුතු ය." මෙය ශ්‍රී ලංකාව ඇතුළු එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන්ගේ කැපීපෙනෙන දේශපාලන ඇපකැපවීමකි. ජාත්‍යන්තර මානව හිමිකම් නීති යටතේ දැනට තිබෙන වගවීම් මත පදනම්ව, රාජ්‍යයන් විසින් ප්‍රකාශනයේ නිදහස, පෞද්ගලිකත්වය සහ වෙනත් මානව හිමිකම් අන්තර්ජාලයේ ආරක්ෂා කිරීමට ගිවිසගෙන තිබේ.

"තම ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම්වලට අනුකූලව ප්‍රකාශනයේ නිදහස, සංවිධානය වීමේ නිදහස, පෞද්ගලිකත්වය සහ වෙනත් මානව හිමිකම් සුරක්ෂා කිරීම සඳහා අන්තර්ජාලයේ ආරක්ෂාව පිළිබඳ කාරණා ආමන්ත්‍රණය කිරීමට" මෙම යෝජනා සම්මතය විසින් එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටියි. "එය ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සහ පාරදෘෂ්‍ය ආයතන ඔස්සේ නීතියේ ආධිපත්‍යය මත පදනම්ව, නිදහස සහ ආරක්ෂාව තහවුරු වන පරිදි අන්තර්ජාලයේ සිදු විය යුතු ය. එයට ආර්ථික, සමාජ සහ සංස්කෘතික සංවර්ධනය ජනනය කරන සක්‍රිය බලවේගයක් ලෙස පැවතිය හැකි ය."



[1] Full text at: https://www.un.org/en/universal-declaration-human-rights/index.html
[2] A non-legal overview of these can be found at: https://www.un.org/en/sections/issues-depth/human-rights/
[3] Official website of HN Human Rights Council: https://www.ohchr.org/EN/pages/home.aspx

# ඇල්ගොරිදමක් යනු කුමක් ද?

ඇල්ගොරිදමක් යනු ප්‍රශ්නයක් යම් ක්‍රියාමාර්ගයක් ඔස්සේ පියවරෙන් පියවර විසඳන ක්‍රමයකි. එය දත්ත විකසනය, ගණනය සහ වෙනත් අදාළ පරිගණක සහ ගණිතමය මෙහෙයුම් සඳහා යොදා ගනු ලැබේ. විවිධාකාරයෙන් දත්ත උපයෝගී කරගැනීමට ද ඇල්ගොරිදම භාවිතා කෙරේ නව දත්ත අයිතමයක් ඇතුළත් කිරීම, නිශ්චිත අයිතමයක් සෙවීම හෝ තේරීම එම ක්‍රම අතර වේ.

Source: https://www.techopedia.com/definition/3739/algorithm

## ඩිජිටල් මානව හිමිකම් යනු මොනවා ද?

මෙතැන් සිට ඉදිරියට අප ඩිජිටල් හිමිකම් යනුවෙන් සඳහන් කළ විට අප අදහස් කරන්නේ ඩිජිටල් මානව හිමිකම් ය. ඩිජිටල් පිටපත් අයිතිය නොවේ. එය අදාළ වන මුත් වෙනත් සාකච්ඡාවකි.

ලෝක ව්‍යාප්ත ජාලය යනු  අන්තර්ජාලයේ රූපමය ස්වරූපය යි. එය බොහෝ ජනයා විසින් භාවිතා කරනු ලැබේ. එය අලුතින් නිපදවනු ලැබුවේ 1989දී ය. එහි පළමු දශකයේදී, 1990 ගණන්වලදී, බොහෝ පරිශීලකයන්ට හැකි වූයේ වෙබ් අඩවි තුළ සෙවීමට (Browser) පමණි. අලුත් වෙබ් අන්තර්ගතයන් නිර්මාණය සඳහා ක්‍රමලේඛ කුසලතා (programming skills) අවශ්‍ය විය. පරිශීලකයන්ට තමන්ගේ ම අන්තර්ගතයන් නිර්මාණය කළ හැකි වූයේ ඊමේල් සහ චැට් (chat) මාර්ගයෙන් පමණි. ඒ වන විට තිබුණු වැදගත් ම ප්‍රශ්නය වූයේ වැඩි පිරිසක් වෙබ් වෙත ගෙන්වාගන්නේ කෙසේ ද යන්නයි.

සංවර්ධිත රටවල මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද අන්තර්ජාල ප්‍රවේශය දැවැන්ත සංවර්ධනයක් ලබා තිබේ. 2018 වසර අවසානය වන විට සමස්ත ලෝක ජනගහනයෙන් අඩකට මඳක් වැඩියෙන් අන්තර්ජාලය හා සම්බන්ධ වේ. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) තක්සේරු කර තිබෙන පරිදි ලෝක ජනගහනයෙන් 51.2%ක් හෙවත් බිලියන 3.9ක් ජනයා අන්තර්ජාලය භාවිතා කළ හ. ආසියා පැසිෆික් කලාපයේ අන්තර්ජාලය භාවිතා කරන ජන ප්‍රතිශතය 47%කි. එයින් අදහස් වන්නේ වැඩිපුර ජනයා අද වන විට අන් කවරදාටත් වඩා සම්බන්ධ වී සියින නමුත්, තවමත් සේවා සම්පාදනය කරගත නොහැකි විශාල සංඛ්‍යාවක් සිටින බව යි.



වසර දෙදහස් ගණන්වල මැදදී, සමාජ මාධ්‍ය බිහිවීමෙන් පසු, සෑම අන්තර්ජාල පරිශීලකයකුට ම වෙබ් අන්තර්ගතයන් පාරිභෝජනය කරන්නට මෙන් ම තමන්ට අවශ්‍ය නම් අන්තර්ගතයන් ප්‍රකාශනය කරන්නට ද අවස්ථාව ලැබිණි. මෙමගින් අලුත් අවස්ථා මෙන් ම අභියෝග ද ඇති විය.

ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමය (APC) යනු 1990දී සන්නිවේදන යටිතල පහසුකම් සැපයීම සඳහා පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධාන ජාලයකි. එම පහසුකම් අතර සාමය ගොඩනැගීම, මානව හිමිකම් සහ තිරසරභාවය වෙනුවෙන් ක්‍රියා කරන්නන්ට අන්තර්ජාල පාදක අයදුම්පත් ද ඇතුළත් වේ. 2006දී ඔවුහු අන්තර්ජාල හිමිකම් ප්‍රඥප්තියක් නිර්මාණය කළ හ. එමගින් පහත දැක්වෙන තේමාවන් ආවරණය කරන ලදී.

- සැමට අන්තර්ජාල ප්‍රවේශය
- ප්‍රකාශනයේ සහ සංවිධානය වීමේ නිදහස
- බෙදාහදා ගනු ලබන අධ්‍යාපනය සහ නිර්මාණය - නිදහස් සහ විවෘත මූලාශ්‍ර ඇති මෘදුකාංග සහ තාක්ෂණික සංවර්ධනය
- පෞද්ගලිකත්වය, ආරක්ෂා කිරීම සහ එන්ක්‍රිප්ට් (encryption) කිරීම
- රාජ්‍ය පාලනය සහ අන්තර්ජාලය
- දැනුවත් කිරීම, ආරක්ෂාව සහ හිමිකම් යථාවත් කිරීම



තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් පරිණාමය වන විට, ඩිජිටල් අවස්ථා සහ අභියෝග ද වෙනස් වේ. වසර ගණනාවක් තිස්සේ, මානව හිමිකම් ක්‍රියාකාරිකයන්, පර්යේෂකයන් සහ සිවිල් සමාජ කණ්ඩායම් විසින් ඩිජිටල් හිමිකම් පිළිබඳ විවාදය යාවත්කාලීන කර තිබේ.

[4] The promotion, protection and enjoyment of human rights on the Internet. UNHRC Resolution A/HRC/32/L.20. Adopted on 27 June 2016. http://ap.ohchr.org/documents/dpage_e.aspx?si=A/HRC/32/L.20
[5] https://news.itu.int/itu-statistics-leaving-no-one-offline/

“අන්තර්ජාලය ගෝලීය පොදු අවකාශයකි. එය විවෘත, සැමට පිවිසිය හැකි, ළඟා කරගත හැකි අවකාශයක් විය යුතු ය. වැඩි වැඩියෙන් පිරිස් මේ වෙත ප්‍රවේශය ලබාගන්නා විට, බොහෝ දෙනෙකු පිටමං කිරීම ද සිදු වේ. එය ගෝලීයකරණ ක්‍රියාවලියේදී නිතරම සිදු වන අතර, අන්තර්ජාල ප්‍රවේශයේ ව්‍යාප්තිය විසින් ද සමාජ ආර්ථික විෂමතා ඇති කරනු ලැබේ. එමගින් බොහෝ විට සමාජ සහ ආර්ථික විෂමතා වර්ධනය කරනු ලැබේ. කෙසේ වෙතත්, අන්තර්ජාලය සහ වෙනත් තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් සමාජය බලමුළුගැන්වීමේ, සංවර්ධනයේ සහ අයුක්තියට එරෙහි ප්‍රතිරෝධයේත්, වෙනස් ප්‍රකාශනයේත්, නිර්මාණශීලීත්වයේත් බලවත් මෙවලම් බවට පත් විය හැකි ය.”

ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමයේ (APC)
අන්තර්ජාල හිමිකම් ප්‍රඥප්තිය, 2006, ආරම්භක වචන

[6] APC Internet Rights Charter, 2006: https://www.apc.org/en/pubs/about-apc/apc-internet-rights-charter

## අන්තර්ජාල භාවිතයේ ස්ත්‍රී පුරුෂ මාන

කාන්තාවන් සහ පුරුෂයන් විසින් අන්තර්ජාලය භාවිතා කරනු ලබන්නේ වෙනස් අන්දමිනි. ඔවුහු අන්තර්ජාලය භාවිතයේදී ලබන අත්දැකීම් වෙනස් ය.

ආරම්භයක් ලෙස, රට අයත් වන කලාපය සහ ආදායම් මට්ටම කුමක් වුවත්, බොහෝ රටවල කාන්තාවන් අන්තර්ජාල පරිශීලකයන් වන්නේ අඩුවෙනි. උදාහරණයක් ලෙස, LIRNEasia ආයතනය විසින් 2018දී ශ්‍රී ලංකාව පුරා කරන ලද සමීක්ෂණයකට අනුව, වයස අවුරුදු 15 - 65 අතර කාන්තාවන් සහ ගැහැණු ළමයින්, එම වයස් කාණ්ඩයේ පුරුෂයින් හට සාපේක්ෂව අන්තර්ජාලය භාවිතා කිරීමේ ඉඩ 34%කින් අවම ය.

ඉන්දීය අන්තර්ජාල සහ ජංගම සංවිධානය විසින් නිකුත් කරන ලද, 2017 වසරේ ඉන්දියාවේ අන්තර්ජාලය පිළිබඳ වාර්තාව පවසන පරිදි, එම වසරේ ඉන්දියාවේ අන්තර්ජාල පරිශීලකයන් අතර කාන්තාවන් සිටියේ 30%ක් පමණි.

කාන්තාවන් අන්තර්ජාලගත වූ විට, ඔවුහු විශේෂ ආකාරවල අන්තර්ජාල හිංසනයන්ට මුහුණ දෙති. එසේ වන්නේ, සරලව ම ඔවුන් කාන්තාවන් වීම නිසා ය. එවැනි හිංසනයන් සිදුවන නිරන්තරයෙන් සිදු වන අතර ඒවායේ තීව්‍රතාව ඉහළ ය. (මේ පිළිබඳ පසු මොඩියුලවල සාකච්ඡා කරනු ලැබේ).

කාන්තා හිමිකම් ක්‍රියාකාරිකයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යේෂකයන් විසින් ඩිජිටල් හිමිකම් සහ වගකීම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවී දැක්මකින් හා ස්ත්‍රීවාදී දෘෂ්ටි කෝණයකින් විග්‍රහ කරනු ලැබේ. ඔවුන් දැඩි ලෙස පෙනී සිටින්නේ, අන්තර්ජාල සහ සාමාන්‍ය ලෝක අතර වෙනස බොඳ කර දමන සාකල්‍ය ප්‍රවේශයක් වෙනුවෙනි. එයින් අදහස් වන්නේ, සමාජයේ පුළුල්ව පැතිර තිබෙන කාන්තාවන් ඉලක්ක කර හිංසාවට ලක්කිරීම දැන් සයිබර් අවකාශයේ ද ඇති බවයි. එයට අවකාශයන් දෙකෙහිදී ම දැඩි ප්‍රතිචාර දැක්විය යුතු ය.

අන්තර්ජාලයේ ස්ත්‍රීවාදී මූලධර්ම (FPI) මතු වූයේ, තාක්ෂණය සම්බන්ධ කාරණා වරනැගීමට සහ අධ්‍යයනය කිරීමට කාන්තා විමුක්ති ව්‍යාපාරවලට රාමුවක් සපයන ප්‍රකාශනයක් ලෙසයි. අතිශය වැදගත් අන්තර්ජාල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ භාවී සහ ලිංගික හිමිකම් දෘෂ්ටි කෝණයක් එමගින් සපයනු ලැබේ. ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමය (APC) විසින් මෙම ක්‍රියාවලියට පහසුකම් සපයන ලදී. එය සිවිල් සමාජ කණ්ඩායම්වල ගෝලීය ජාලයකි.

වර්තමානයේදී පොකුරු පහකට ගොනු කරන ලද මූලධර්ම 17ක් තිබේ. එම පොකුරු පහ වන්නේ, ප්‍රවේශය, චලනය, ආර්ථිකය, ප්‍රකාශනය සහ අන්තර්ගත කරගැනීමයි.

පූර්විකාවේ මෙසේ සඳහන් වේ: "ස්ත්‍රීවාදී අන්තර්ජාලයක් ක්‍රියාත්මක වන්නේ කාන්තාවන් සහ විවිධාකාර පුද්ගලයන් බල ගන්වමින් හිමිකම් පූර්ණ අන්දමින් භුක්ති විඳීමටත්, සතුට ළඟා කර ගැනීමටත්, පුරුෂමූලිකත්වය පිටුදැකීමටත් ය. , වයස, ආබාධ සහිතබව, ලිංගිකභාවයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ ප්‍රකාශන, සමාජ-ආර්ථික මට්ටම්, දේශපාලන සහ ආගමික විශ්වාසය, වාර්ගික සම්භවයන් සහ වාර්ගික සලකුණු කිරීම් ආදී අපගේ එකිනෙකට වෙනස් යථාර්ථ, සංදර්භ සහ විශේෂතා එයට ඇතුළත් වේ. "

මෙම මූලධර්මවල වැදගත් කරුණක් වන්නේ අන්තර්ජාලයේ දී ඇති වන ප්‍රශ්න බාහිර සමාජයේ සිදු වන දේ සමග ද සමීපව සම්බන්ධ වීමයි. අන්තර්ජාලයේ සහ බාහිර සමාජයේ කරුණු එකිනෙක හා සමපාත වේ. සියලු දෙනාගේ ඩිජිටල් හිමිකම් වෙනුවෙන් පෙනී සිටීමේදී ඒ ගැන අධ්‍යයනය කළ යුතු ය.

අන්තර්ජාලය පිළිබඳ ස්ත්‍රීවාදී මූලධර්ම විසින් පහත දැක්වෙන වැදගත් ප්‍රශ්න ඇසීමට අපට බල කෙරේ:

- ඩිජිටල් රාජ්‍යය වෙත ප්‍රවේශය ඇත්තේ කාට ද?
- එසේ ප්‍රවේශය තිබෙන අයට තමන්ගේ අදහස් නිදහසේ ප්‍රකාශ කළ හැකි ද?
- එසේ කළහොත් ඇති වන ප්‍රතිඵල මොනවා ද? විශේෂයෙන් ම, දැනටමත් අවදානම්වලට මුහුණ දෙන කණ්ඩායම්වලට කුමක් සිදු වේ ද?
- අන්තර්ගතයන් නිර්මාණය කරන්නේ සහ බෙදාගන්නේ කවුරු ද? එම අන්තර්ගතයන් කෙතරම් ඇතුළත් කරගන්නාසුළු ද?
- ඩිජිටල් ලෝකයේ තිබෙන ප්‍රතිඵල සහ අවස්ථා මොනවා ද? සෑම කෙනෙකුට ම, අවස්ථා වෙත සමාන ප්‍රවේශය ඇති බව තහවුරු කිරීම සඳහා අපට අවශ්‍ය මොනවා ද?





[7] https://lirneasia.net/2019/05/afteraccess-findings-from-sri-lanka-released-in-colombo-today-event-report/
[8] Read all Feminist Principles of the Internet at: https://feministinternet.org/en

“පොදු අවකාශයන් වෙත කාන්තාවන්ට ප්‍රවේශය ලබාදීම නිරතුරුව ම හෙළා දකිනු ලැබේ. එයට හේතුව වන්නේ පුරුෂයින් පොදු අවකාශයන් තුළදී තම පුරුෂෝත්තමවාදය පාලනය කරගැනීමට බැරි වීමයි. තාක්ෂණය භාවිතය වර්ධනය වූ විට, කාන්තාවන් අන්තර්ජාලය භාවිතා කිරීම ද සීමා කරන ලදී. එයට හේතුව කාන්තාවන් එය වෙත ප්‍රවේශය ලබාගන්නට පෙර පුරුෂයින් ඒ වන විටත් එම අවකාශය අත්පත් කරගෙන සිටීමයි. කාන්තාවන් අන්තර්ජාල හිංසනයට නිරතුරුව ම ලක්වීමට හරියට ම හේතුව වන්නේ, ඔවුන් අන්තර්ජාලයේ සුළුතරයක් වීමයි.”

Nighat Dad, නීතිඥ, මානව හිමිකම් ක්‍රියාකාරික සහ  පකිස්තානයේ
ඩිජිටල් හිමිකම් පදනමේ විධායක අධ්‍යක්ෂ

## අන්තර්ජාලයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

විශ්ව මානව හිමිකම් ප්‍රකාශයේ 19 වන වගන්තිය විසින් අදහස් දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහස ආවරණය කරනු ලැබේ. එයට, නිදහසේ කතා කිරීමේ, ප්‍රකාශයට පත් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ නිදහස ද, දේශසීමාවලින් තොරව එවැනි තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම ද ඇතුළත් වේ. මෙය වනාහි ඩිජිටල් යුගයේ ඉතා වැදගත් හා ප්‍රමුඛ අයිතීන් අතරින් එකකි.

අන්තර්ජාලය පෞද්ගලික සන්නිවේදනය, ස්වයං ප්‍රකාශනය, තොරතුරු බෙදාහදාගැනීම මෙන් ම ප්‍රසිද්ධ කිරීම හා විකාශනය සඳහා ද වැදගත් වේදිකාවක් බවට පත් වී තිබේ. එය ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් වෙනුවෙන් ක්‍රියා කරන්නන්ට බලමුළුගැන්විය හැකි සහ දේශපාලන, සමාජ සහ ආර්ථික ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටිය හැකි සක්‍රිය අවකාශයක් ලෙස ද මතු වී තිබේ.

මෙම වකවානුවේදී ම, ඉහත කී දෑ යථාර්ථයක් බවට පත් කරන ඩිජිටල් තාක්ෂණයන්ම වාරණය හා මහා පරිමාණ අන්තර්ජාල වසාදැමීම් මගින් තොරතුරු වෙත ප්‍රවේශය සීමා කිරීම සඳහා ද, කලින් හැකියාව නොතිබුණු තරම් මහා පරිමාණයෙන් රාජ්‍ය විසින් ප්‍රකාශනයට බාධා කිරීම සඳහා ද යොදාගත හැකි ය.

එබැවින්, අවස්ථා මෙන් ම තර්ජන ද තේරුම් ගැනීම අපට වැදගත් ය.

වර්තමානයේදී පොදුවේ වෙබ් සහ සමාජ මාධ්‍ය විශේෂයෙන් සෑම අයෙකුට ම, ඕනෑම තැනකදී අන්තර්ජාල ප්‍රවේශයෙන් සහ මූලික ඩිජිටල් කුසලතාවලින් තම අදහස් ප්‍රකාශනයට අවස්ථාව ලබා දෙයි. ඇතැම් විට ඒ ගෝලීය පාඨක පිරිසකට ය. එය ෆේස්බුක්, ට්විටර් වැනි සමාජ මාධ්‍යවල බ්ලොග්, පෝස්ට්, කමෙන්ට් මගින් මෙන් ම, රූප මාධ්‍ය වන ඉන්ස්ටග්‍රෑම් හෝ යූ ටියුබ් මගින් විය හැකි ය. වෙනත් වේදිකාවන් ද දුසිම් ගණන් තිබේ. ඒවායින් වැඩි හරියක් ගාස්තු රහිත සාමාජිකත්වයට ඉඩ දෙන අතර භාවිතය ද පහසු ය. (කේතකරණ කුසලතා අවශ්‍ය නැත.)

මෑතක් දක්වා ම, පුවත්පත්, රේඩියෝ සහ රූපවාහිනී වැනි ජනමාධ්‍ය සමාගම්වල ප්‍රසිද්ධ කිරීමේ හැකියාව සීමිත විය. ඒවා පිහිටුවීමට සහ පවත්වාගෙන යාමට විශාල ආයෝජන සහ සංස්කාරකවරු හා පුවත්පත් කලාවේදීන් වැනි පුහුණු වෘත්තිකයන් අවශ්‍ය විය. වෙබ් මගින්, අන්තර්ගතයන් නිර්මාණය හා පළ කිරීම පහසු කරන ලදී.

එමගින්, භූගෝලීය සීමා හා කාල කලාප පුරා විවිධ ප්‍රජා කණ්ඩායම් ඉස්මතු වීම ද සිදු විය. අන්තර්ජාලයේ නිදහස් ප්‍රකාශනය සම්බන්ධ එක් වඩාත් ම වැදගත් අවස්ථාවක් වන්නේ නිශ්චිත පාඨක ප්‍රජාවක් වෙත ළඟාවීමට හා සම්බන්ධ වීමට තිබෙන හැකියාවයි. එය විශේෂයෙන් ම, පුද්ගලයන් ලෙස කතා කිරීමේ නිදහස නොමැති පරිසරයන් තුළ ජීවත් වන පුද්ගලයන්ට වැදගත් වේ.

“හුදෙක් තොරතුරු ලබාගැනීම නොව, වෙනත් අය සමග සම්බන්ධ වීමේ හැකියාව, අන්තර්ජාලයේ සැබෑ ප්‍රජාතාන්ත්‍රීයකරණ අංගය බවට පත් වී තිබේ. එය නිදහස් ප්‍රකාශනයේ ප්‍රධාන සම්පතකි,” යි ප්‍රකාශනයේ නිදහස පිළිබඳ කැනේඩියානු ක්‍රියාකාරිනියක වන ලෝරා ට්‍රයිබ් පවසයි.

ශ්‍රී ලංකාවේදී, ප්‍රකාශනයේ නිදහසෙහි අවසන් සීමාව වෙබ් මගින් නියෝජනය වේ. ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය වෙත ප්‍රවේශය ඒවා පාලනය කරන්නන් (හිමිකරුවන්, සංස්කාරකවරු) විසින් සියුම් ලෙස වළක්වනු ලැබේ. ඔවුන්ගෙන් වැඩිදෙනෙකු පොදු යහපත වෙනුවෙන් පෙනී සිටින්නේ නැත. ඒ වෙනුවට පෞද්ගලික න්‍යාය පත්‍ර ප්‍රවර්ධනය කරති. නැතිනම්, දැඩි ස්වයං වාරණයක් පවත්වාගෙන යති. මෙයට එදිරිව, වෙබ් විසින්, පුරවැසියන් සඳහා ඉතා වැදගත් විකල්ප අවකාශයක් සපයනු ලැබේ. බොහෝ අය, පොදු වැදගත්කමක් තිබෙන, එහෙත්, බොහෝ විට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් හරි හැටි වාර්තා නොකරන, නොසළකා හරිනු ලබන හෝ වාරණය කරනු ලබන විවිධ මාතෘකාවන් සාකච්ඡා කිරීමේ මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන තිබේ.

> “තොරතුරුවල විවෘත ගලා යාම නූතන සමාජයේ අන්තර්ජාලයේ පරිවර්තනීය ප්‍රතිඵලයේ ප්‍රධාන සාධකයයි. වරප්‍රසාද ආරක්ෂා කරගැනීම පිණිස, අන්තර්ගතය පිළිබඳ කාරණා ආමන්ත්‍රණය කිරීමේදී සහ අන්තර්ජාල ව්‍යූහයේ තාක්ෂණික කළමනාකරණය අර්ථ නිරූපණය කිරීමේදී, නිදහස් ප්‍රකාශනයේ හිමිකම ආරක්ෂා කළ යුතු ය.”
>
> ආටිකල් 13 (උද්දේශන සංවිධානය)
> https://www.article19.org/issue/digital-rights/

## වෛරී ප්‍රකාශ: ප්‍රකාශනයේ නිදහස අවභාවිතය

ප්‍රකාශනයේ නිදහස යනු සීමාවකින් තොර අයිතියක් නොවේ. එහි සාධාරණ සීමා තිබේ. එසේ අවසර නොලැබෙන එක් ප්‍රකාශන වර්ගයක් වන්නේ වෛරී ප්‍රකාශයි.

අන්තර්ජාලයේ මෙන් ම තත් කාලීන සමාජයේ ද වෛරී ප්‍රකාශ වැළැක්වීම පරිස්සමෙන් කළ යුතු කාර්යයකි. අනවශ්‍ය කාර්යයන් නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා ශ්‍රී ලංකාව අත්සන් තබා තිබෙන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් මඟින් තහවුරු කර තිබෙන ප්‍රකාශනයේ නිදහසට බාධා සිදුවිය හැකි ය.

වෛරී ප්‍රකාශවලට විවිධ අර්ථ නිරූපණ තිබේ. සරලව, වෛරී ප්‍රකාශ යනු ජාතිය, ජනවර්ගය, ආගම, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව සහ ලිංගික නැඹුරුව මත පදනම් වූ ද්වේශ සහගත ප්‍රකාශ වේ. වැදගත් ම කාරණය වන්නේ වෛරී ප්‍රකාශ, වරදකාරී ප්‍රකාශවලින් වෙනස් වීමයි. එම කාරණා දෙක ඒකාබද්ධ නොකළ යුතු ය. යමෙකු "තිගැස්මට, වරදකාරීත්වයට, කරදරයට" පත් කරන ප්‍රකාශවලට හා අදහස්වලට ද ප්‍රකාශනයේ නිදහස තිබේ. ප්‍රසිද්ධ ගත් කතුවර සල්මන් රෂ්ඩි පැවසූ පරිදි, "ප්‍රකාශනයේ නිදහස යනු කුමක් ද? වරදකාරීත්වය සඳහා නිදහස නොමැති නම්, එහි පැවැත්මක් නැත. "

ශ්‍රී ලංකාවේ වෛරී ප්‍රකාශ තේරුම් ගත යුත්තේ සිවිල් යුද්ධය හා යුද්ධය අවසන් වීමෙන් පසු 2009 සිට මන්දගාමීව සිදුවන සංහිඳියා ක්‍රියාවලිය ඇසුරෙනි. සන්නද්ධ අරගලය විසින් ශ්‍රී ලාංකික සමාජය ජනවාර්ගික, ආගමික සහ දේශපාලනික බෙදීම් ඔස්සේ දැඩි ලෙස ධ්‍රැවීකරණය කරන ලදී. ඒ හේතුවෙන් විවිධ ස්වරූපවල අති ජාතිකවාදයන් ඉස්මතු විය. ජාතික සුවපත් කිරීම වෙනුවට දේශපාලන පක්ෂ විසින් කර තිබෙන්නේ මේවා ප්‍රයෝජනයට ගනිමින් බෙදීම් වැඩි කිරීමයි. (මෙම මොඩියුලය අවසානයේ ඇති සිද්ධි අධ්‍යයනය - 1 කියවන්න.)

වෛරී ප්‍රකාශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතියෙහි හිදැස් නැත. පවත්නා නීතිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන් අනුගත ය. ප්‍රශ්නය වන්නේ ඒවා ක්‍රියාත්මක වන ආකාරයයි. වෛරී ප්‍රකාශ පිටුදැකීම සඳහා නීත්‍යානුකූල විවේචනයට හා සම්මතයට එරෙහි වීමට ඉඩ දීම ඉතා වැදගත් ය.

යුනෙස්කෝ සංවිධානය විසින් 2015 වසරේ දී කරන ලද ගෝලීය අධ්‍යයනයකදී මෙසේ සඳහන් කරන ලදී: "(වෛරී ප්‍රකාශවලට) අදාළ ඕනෑම සීමා කිරීමක් නීතියෙන් විග්‍රහ කර තිබිය යුතු ය. එසේ නොමැතිව බලහත්කාරයෙන් ක්‍රියාත්මක නොකළ යුතු ය. ඒවා, සීමා කිරීම සමානුපාතිකව සිදුකරන ලද ‍අනිවාර්යතාවයන් විය යුතු ය. එමගින් නීත්‍යානුකූල ප්‍රකාශවලට කිසිදු බාධාවක් සිදු නොවිය යුතු ය.

එම අධ්‍යයනයේ මාතෘකාව වූයේ 'අන්තර්ජාලයේ වෛරී ප්‍රකාශවලට එරෙහිව කටයුතු කිරීම් ය. එහිදී යුනෙස්කෝ සංවිධානය මෙසේ ද පැවසී ය: "ප්‍රකාශනයට එරෙහි ඕනෑම සීමා කිරීමක් ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුගත වීම අවශ්‍ය ය. එය බලය යෙදවීමක් නොවිය යුතු ය. වෙනත් අයගේ හිමිකම් ද අන්තර්ග්‍රහණය කර ගැනීමේ අරමුණෙහිදී, එම අරමුණු ජාතික ආරක්ෂාව, මහජන සුචරිතය හෝ මහජන සෞඛ්‍යය විය හැකි ය."

අන්තර්ජාලයේ වෛරී ප්‍රකාශවලට ප්‍රතිචාර දැක්වීමේ නීතිමය නොවන ක්‍රම කීපයක් යුනෙස්කෝ විසින් නිර්දේශ කර තිබේ. පුද්ගලයන්ට කථනයේ යෙදිය හැකි ය. සිවිල් සමාජ කණ්ඩායම්වලට වෛරී ප්‍රකාශ නිරීක්ෂණය, ලේඛනගත කිරීම සහ අවස්ථාව ඇති විට, ඒවා බලධාරීන් වෙත නීතිමය කටයුතු සඳහා සාක්ෂි සහිතව වාර්තා කිරීම කළ හැකි ය. අන්තර්ජාල සමාගම් විසින් වැඩි අවධානයකින් කටයුතු කළ යුතු යයි මේ සම්බන්ධව කටයුතු කරන කණ්ඩායම් විසින් බලපෑම් කළ හැකි ය.

කෙටි හෝ දිගුකාලීනව, වෛරී ප්‍රකාශවලට එරෙහිව සැබෑ ආරක්ෂාවන් ගොඩනැගිය හැක්කේ මිනිස් මනස තුළ ය. ඩිජිටල් සාක්ෂරතාව පුළුල් කිරීම සහ වෛරී ප්‍රකාශවලට එරෙහිව කටයුතු කිරීමට අන්තර්ජාල ප්‍රජාවට ඇති හැකියාවන් වර්ධනය කිරීම මෙහිදී ඉතා වැදගත් ය.

# වෛරී ප්‍රකාශ පිළිබඳ ෆේස්බුක් අර්ථ නිරූපණය

ෆේස්බුක් නීති හැඳින්වෙන්නේ ප්‍රජා ප්‍රමිතීන් ලෙසයි. එමගින් වෛරී ප්‍රකාශ අර්ථ නිරූපණය කර තිබෙන්නේ, “ආරක්ෂිත ලක්ෂණ ලෙස අප විසින් හඳුන්වනු ලබන, ජාතිය, ජනවර්ග, ජාතික සම්භවය, ආගමික බැඳීම්, ලිංගික නැඹුරුව, කුලය, ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ භයානක රෝග හෝ ආබාධ සහිතභාවයට එරෙහි සෘජු ප්‍රහාර”ලෙසයි. සංක්‍රමණික තත්වයන්ට යම් ආරක්ෂාවක් ද එමගින් සපයනු ලැබේ.

Source: https://www.facebook.com/communitystandards/

# වෙබ් වාරණය


අන්තර්ජාලය නිර්මාණය කරනු ලැබුවේ විවෘත වේදිකාවක් වීම පිණිස ය. එහි පාලනය සඳහා වන නිදහස්කාමී ප්‍රවේශය පදනම් වන්නේ විවෘත හා ප්‍රවේශ වීමේ පහසුව තිබෙන අන්තර්ජාලය විවෘත සහ ප්‍රජාතාන්ත්‍රික සමාජවල සාර්ථකත්වයේ මූලධර්මයක් ය යන පදනම මත ය.

කෙසේ වෙතත්, අන්තර්ජාලයේ භාවිතාවන් (සහ අවභාවිතාවන්) තීව්‍රතාව මෙන් ම සංකීර්ණත්වය පැත්තෙන් ද වැඩි වෙමින් තිබේ. එහි සම්භවය සහ මූලධාර්මික වටිනාකම් දැඩි පරීක්ෂාවට ලක් වේ. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා විවෘත අන්තර්ජාලය (Open Internet for Democracy) නම් කණ්ඩායම මෙසේ පවසයි: “දේශපාලන හා සමාජ කතිකාවන් අන්තර්ජාලය දෙසට යොමු වීම වැඩි වීම හේතුවෙන් ඒ හා සමපාතව අන්තර්ජාලය සම්මතයට එරෙහිව යාම වැළැක්වීමට, ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීමට සහ පවත්නා අසමානතා තිරසර කිරීමට භාවිතා කිරීමෙහි ද වර්ධනයක් සිදු වේ. ප්‍රවේශය සහ භාවිතය සම්බන්ධ අසමානතාවලට ද එය එසේ ම සිදු වේ.”

අන්තර්ජාලයේ නිර්මාපකයෝ බොහෝ දෙනෙකු ලිබරල් අදහස් දැරූ විද්‍යාර්ථීන් හෝ තාක්ෂණවේදීන් ය. ඔවුන්ගේ දැක්ම තුළ සිය නිර්මාණය විවෘත සහ නිදහස් විය. එහෙත් එය පුළුල් වෙමින් පරිණාමය වන විට, අන්තර්ජාලය පාලනය කළ යුතු ආකාරය පිළිබඳව බොහෝ මතභේදාත්මක, එහෙත් නොවිසඳුණු, විවාද ඇති වී තිබේ.

එහි සැලැස්මේ ස්වභාවය නිසා ම, අන්තර්ජාලය වෙන වෙන ම රාජ්‍යයන් විසින් ජාතික නීති හා රෙගුලාසි මගින් පාලනය කළ නොහැකි ය. එහෙත්, ඇතැම් රාජ්‍යයන් පෙරහන් කිරීම (filter), නිරීක්ෂණය සහ වෙනත් වාරණයන් සඳහා ක්‍රම සකසාගෙන තිබේ. එමගින් අන්තර්ජාලයේ විවෘතභාවයට බාධා පමුණුවනු ලැබේ. ඇතැම් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍ය පවා, නීතිමය, ආර්ථික සහ ඩිජිටල් මාධ්‍ය විසින් ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති කරන ලද අභියෝග වැනි කාරණා විෂයෙහි විවිධ සීමා කිරීම් සලකා බලා හෝ දැනටමත් ක්‍රියාත්මක කර හෝ තිබේ.

අන්තර්ජාල නිදහස සහ එහි සාධාරණ සීමා පිළිබඳ ගෝලීය විවාද මෙමගින් වැඩි වී තිබේ. ජාත්‍යන්තර නීතිය යටතේ, නිදසුනක් ලෙස, විශේෂයෙන් ම රාජ්‍ය ව්‍යුහයක් විසින් තීරණය කර, එම රජය විසින් ම, පරිපාලන පදනමකින් වෙබ් අඩවි වාරණය කිරීම, ප්‍රකාශනයේ නිදහස සම්බන්ධව සාධාරණීකරණය කළ හැකි සීමාකිරීමක් නොවේ.



"දේශපාලන හා සමාජ කතිකාවන් අන්තර්ජාලය දෙසට යොමු වීම වැඩි වීම හේතුවෙන් ඒ හා සමපාතව අන්තර්ජාලය සම්මතයට එරෙහිව යාම වැළැක්වීමට, ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීමට සහ පවත්නා අසමානතා තිරසර කිරීමට භාවිතා කිරීමේ වර්ධනයක් සිදු වේ. ප්‍රවේශය සහ භාවිතය සම්බන්ධ අසමානතාවලට ද එය එසේ ම සිදු වේ."

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා විවෘත අන්තර්ජාලය

"සයිබර් තර්ජනවලට, අන්තර්ජාල වෛරයට සහ ත්‍රස්තවාදයට, ප්‍රතිචාර දැක්වීමට බොහෝ රාජ්‍යයන්ට බලපෑම් තිබේ. හිමිකම්වලට ගරු කරන රාජ්‍යයන් පවා ආරක්ෂාව හා මානව හිමිකම් අතර වැරදි තෝරාගැනීමක් සිදු කළ හැකි ය. උදාහරණයක් ලෙස, ආරක්ෂාවේ නාමයෙන්, එන්ක්‍රිප්ට් කිරීම (encryption) යටපත් කිරීම හෝ ඔදර බ්‍රව්සරය වැනි නිර්නාමිකත්ව මෙවලම් තහනම් කිරීම නිදහස් ප්‍රකාශනයට සහ පුද්ගල රහස්‍යභාවයට හැමතැනකදී ම තර්ජනයකි. වැඩි ආරක්ෂාවක් පිළිබඳ පොරොන්දුව නව තාක්ෂණයන් විසින් පිරිනැමිය හැකි ය. එහෙත්, ඒවා ද රජයන් විසින් භාවිතා කළ හැකි ය. එසේ කරන්නේ ආරක්ෂාවේ නාමයෙනි. පරීක්ෂණයට ලක් වන සමාජයක් බිහි කිරීම නිදහස සහ පෞද්ගලිකත්වයට බාධාවකි."

අන්තර්ජාල සමාජයේ ගෝලීය අන්තර්ජාල වාර්තාව - 2017

# පෞද්ගලිකත්වයට තිබෙන අයිතිය

පෞද්ගලිකත්වයේ අයිතිය ද විශ්ව මානව හිමිකම් ප්‍රකාශයේ 12 වන වගන්තියෙන් සහ ඉන් අනතුරුව එළඹෙන ලද ජාත්‍යන්තර ගිවිසුම් මඟින් තහවුරු කර තිබේ. වර්තමානයේදී දිනෙන් දින වැඩි වන ඩිජිටල් ජීවිතය සහ අන්තර්ජාල සේවා භාවිතය හේතුවෙන් පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමේ සංකීර්ණතාවය වැඩි වී තිබේ.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව විසින් තත්කාලීන සන්නිවේදනයෙහි හා තොරතුරු බෙදාගැනීමෙහි දැවැන්ත සංවර්ධනයක් සිදු කර ඇත. ඒ අතරතුර ම, මෙම තාක්ෂණයන් අනවසර හසුකරගැනීම්වල, විද්‍යුත් පරීක්ෂාවට ලක් වීමේ සහ දත්ත උකහා ගැනීමේ අවදානමට ලක් වේ.

පරම පෞද්ගලික ආරක්ෂාව අන්තර්ජාලයේ නැති දෙයකි. සෑම ක්‍රියාවක් ම ස්වයංක්‍රීයව කොහේ හෝ සුචිගත වෙයි. අවසානයේදී එය හඳුනාගත හැකි ය. මෙම යථාර්ථය තුළ, කෙසේ වෙතත්, පෞද්ගලිකත්වය පාලනයේ සාධාරණ මට්ටමක් නිර්මාණය කිරීමට පුළුවන. එහෙත්, එය ඇත්තට ම සිදු වේ ද යන්න තහවුරු කිරීම තාක්ෂණික සේවා සපයන්නන්ගේ, තාක්ෂණය භාවිතා කරන්නන්ගේ සහ රාජ්‍ය නියාමනයන්ගේ වගකීමකි.

අවාසනාවට මෙන්, බොහෝ අන්තර්ජාල සේවා පරිශීලකයන්, අන්තර්ජාලයේ තිබෙන බහුවිධ පෞද්ගලිකත්ව බොරු වලවල් පිළිබඳ දන්නෙ නැත. ඇතැමෙකු තම පෞද්ගලිකත්වය තමනුත් නොදැන අහිමි කරගනිති.

සයිබර් අවකාශයේ අන්තර් ක්‍රියා සම්බන්ධයෙන් එක් ප්‍රධාන අභියෝගයක් වන්නේ, පොදු සහ පෞද්ගලික ජීවිතවල සීමාවන් බොඳ වී යාමයි. මෙය විශේෂයෙන් ම, සමාජ මාධ්‍යවලට අදාළ වේ. එහි පොදු සහ පෞද්ගලික අවකාශයන් එකට පවතින අතර නිතර එකිනෙකට සමානුපාත වේ.



[9] https://openinternet.global/about-open-internet-democracy-initiative

# ඩිජිටල් වගකීම්

“විශාල බලයක් සමග විශාල වගකීමක් ද ඇති වේ!” මෙය ස්පයිඩර්මෑන් චිත්‍රකතා පොත්වලින් ජනප්‍රිය කරන ලද ප්‍රසිද්ධ කියමනකි.

මෙම අවවාදය, ඩිජිටල් තාක්ෂණයේ සහ වෙබ් ජාලයේ සෑම පරිශීලකයකුටම අදාළ ය. එතරම් තොරතුරු ප්‍රමාණයකට ප්‍රවේශය සමග, එතරම් පුළුල්ව සහ වේගවත්ව සන්නිවේදනය කිරීමට හැකියාව ලැබීමේදී සුවිසල් වගකීමක් ඇති වේ. ඒ එය කරන අතර හොඳින් හැසිරීමට ය.

මෙය සෑම පුද්ගලයකුගේ ම පෞද්ගලික වගකීමකි. එය විවිධාකාරයෙන් පුළුල් වී තිබේ. එක් සාකච්ඡාවකදී, එකී ප්‍රධාන වගකීම් ලැයිස්තුගත කරනු ලැබුවේ මෙසේ ය:

- වධදීම්, හිංසා කිරීම්, ලිංගික පණිවුඩ යැවීම් හෝ අනන්‍යතා සොරකම් වාර්තා කිරීමේ වගකීම
- පර්යේෂණ මූලාශ්‍ර දැක්වීමේ වගකීම
- සංගීතය, වීඩියෝ සහ වෙනත් දේ නීත්‍යානුකූල ලෙස බාගත කිරීමේ වගකීම
- දත්ත/ තොරතුරු හැකර්වරුන්ගෙන් ආරක්ෂා කර තබා ගැනීමේ වගකීම
- ඔබගේ අනන්‍යතාව සම්බන්ධයෙන් බොරු නොකිරීමේ වගකීම

මාතෘකාව පිළිබඳ වෙනත් සාකච්ඡාවකදී, පහත සඳහන් පෞද්ගලික වගකීම් ඵලදායී ඩිජිටල් පුරවැසිභාවය සම්බන්ධයෙන් සම්බන්ධ කර තිබේ.

- **සයිබර් වධදීම්:** ඔබ වෙනත් ඩිජිටල් පරිශීලකයන් සමග අන්තර් ක්‍රියා කරන අන්දම සම්බන්ධයෙන් ඔබ වගකිව යුතු ය. හිංසාකාරී සම්බන්ධතාවයන්ගෙන් තමන් ආරක්ෂා කරගැනීම ද ඔබගේ වගකීමකි.
- **අන්තර්ජාල ආරක්ෂාව:** පෞද්ගලික ආරක්ෂාවට හැම විට ම ප්‍රමුඛතාව දිය යුතු ය. අන්තර්ජාල ආරක්ෂාව අදාළ වන්නේ ළමයින්ට, සයිබර් වධදීම්වලට, ලිංගිකව හිංසා කරන්නන්ට පමණක් යයි බොහෝ පරිශීලකයෝ වැරදි ලෙස විශ්වාස කරති. එහෙත්, එයින් තවත් බොහෝ දේ ආවරණය වේ. සෑම කෙනෙකු ම මූලික ආරක්ෂක පියවර ගත යුතු ය.

- **අන්තර්ජාල ආචාර ධර්ම:** යතුරු පුවරු කෙටි මං (shortcuts) ද අන්තර්ජාල සන්නිවේදනයට අයත් වේ. එහෙත්, ඇතැම් විට, කෙටි මං හේතුවෙන් අවබෝධයට සහ වෘත්තීය හුවමාරුවලට බාධා සිදු විය හැකි ය. උදාහරණයක් ලෙස, සම්පූර්ණයෙන් ම කැපිටල් අකුරෙන් ටයිප් කිරීම හොඳ අදහසක් නොවේ.

- **වැරදිකරුවන් වාර්තා කිරීම:** අප ඩිජිටල් වැරදිකරුවන් සමග ගනුදෙනු කිරීමේදී, ඔවුන්ගේ එම චර්යාව අවසන් වන පරිදි කටයුතු කිරීම ඩිජිටල් පුරවැසිභාවයේ වගකීමකි. එය, අයෝග්‍ය අන්තර්ගතයන් සම්බන්ධයෙන් හෝ සයිබර් වධදීම් සම්බන්ධයෙන් අදාළ සේවාවක් වෙත වාර්තා කිරීම/ පැමිණිලි කිරීම වැනි මූලික දෙයක් විය හැකි ය. වරදෙහි ස්වභාවය සහ තත්වය අනුව, ඔබට නීතිමය අධිකාරීන්ට වාර්තා කිරීමට සිදු විය හැකි ය.

- **නීතිමය ආරක්ෂාව:** තම රටේ අන්තර්ජාල ක්‍රියා පාලනය කරන නීති පිළිබඳ ඉගෙනීම අන්තර්ජාලයේ තමන් ආරක්ෂා වීමට අයත් වේ. උදාහරණයක් ලෙස, ඔබ ඩිජිටල් පිටපත් හිමිකම් නියාමනය ගැන දන්නවා ද? තේරෙනවා ද? ඔබ මෘදුකාංග සොරකම් කිරීම කරන වෙබ් අඩවි ඔබට හුරු පුරුදු ද? කිසිවෙකු ඔබගේ ඩිජිටල් අනන්‍යතාව සොරකම් කිරීම වළක්වාගන්නේ කෙසේ ද?



## අන්තර්ජාලය අසල්වැසියකු ලෙස සැලකීම

ජැකී මරේ එක්සත් ජනපදයේ පාසල් ගුරුවරියකි. ඇය වසර විස්සකට වැඩි කාලයක් ද්විතීයක පාසල් සිසුන්ට තාක්ෂණය ඉගැන්වූ ගුරුවරියකි. ඇය ඩිජිටල් වගකීම පිළිබඳ ප්‍රවේශයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනා කරයි.

අන්තර්ජාලය ද අසල්වැසියකු හා සන්සන්දනය කර සිතන්න.

- අන්තර්ජාලයේදී ද ඔබගේ අසල්වැසියා සමග කටයුතු කරන ආකාරයට ක්‍රියා කරන්න.
- පෞද්ගලික තොරතුරු බෙදාගැනීමෙන් වළකින්න. අනෙක් අයගේ පෞද්ගලික තොරතුරු ද ඇසීමෙන් වළකින්න. ඔවුන්ගේ පෞද්ගලිකත්වයට ගරු කරන්න.
- ඔබ අවට පරිසරය ගැන දැනුවත් වන්න. සයිබර් අවකාශයේදී ද ඔබ සිටින්නේ කොතැන ද යන්න දැනගෙන ඉන්න. ඒ අනුව කටයුතු කරන්න.
- ප්‍රජාවේදී මෙන් ම මෙහිදී ද ඔබ කාරුණික නම් අනෙක් අය ද ඔබට කාරුණික වනු ඇත.
- නිර්නාමිකත්වය නිසා ඔබ ආරක්ෂිත යයි නොසිතන්න. එසේ නැත. අයිපී ලිපිනයක් **(IP address)** මඟින් ඔබව පහසුවෙන් හඳුනාගත හැකි ය. එය කුමක්දැයි සාකච්ඡා කරන්න.
- ඔබේ දැනුම බෙදාහදාගන්න. අන්තර්ජාලයේදී සෙසු අයට උපකාර කරන්න.

Source: https://www.teachhub.com/technology-classroom-digital-rights-responsibilities

## සිද්ධි අධ්‍යයන

### සිද්ධි අධ්‍යයනය 1: ශ්‍රී ලංකාවේ මුහුණු පොතෙහි (FACEBOOK) වෛරී ප්‍රකාශ

අන්තර්ජාලයේ පැතිරෙන වෛරී ප්‍රකාශ පිළිබඳ අනතුරු ඇඟවීම් වසර ගණනක සිට සිදු වේ. ඒ ගැන සංවේදී සමාජ ක්‍රියාකාරීන් සහ පර්යේෂකයන් කිහිප දෙනෙක් රැස්වී, විශේෂයෙන් ම ෆේස්බුක්හි වැඩි වන වෛරී ප්‍රකාශ ප්‍රමාණය විශ්ලේෂණය කළ හ.

2014දී කරන ලද එවැනි පළමු දේශීය අධ්‍යයනය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කරන ලදී. එහි මෙසේ දැක්වේ: "ශ්‍රී ලංකාවේ අන්තර්ජාලයේ වෛරී ප්‍රකාශ වර්ධනය තවත් සංහාරයකට හේතු වන්නේ නැත. එහෙත්, රජයට, සමස්තයක් ලෙස සමාජ, ජනවාර්ගික, සංස්කෘතික සහ ආගමික සහජීවනයට, විවිධත්වයට සහ අවසානයේදී පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ අප සංවිධානය වන හා දකින ආකාරය පිළිබඳ විවාදයන්ගේ මධ්‍යයට එමගින් වෙනත් අභියෝග පෙළක් ම ඇති වේ."

'ප්‍රචණ්ඩත්වයට කැමති වීම: ශ්‍රී ලංකාවේ ෆේස්බුක්හි වෛරී ප්‍රකාශ පිළිබඳ අධ්‍යයනයකි' ලෙස නම් කරන ලද වාර්තාව විසින් ශ්‍රී ලංකාවේ ෆේස්බුක් සමූහය 20ක් මාස කීපයක් අධ්‍යයනය කළේ ය. එහිදී අවධානය යොමු කරනු ලැබුවේ 2014 ජූනි මස අලුත්ගමදී මුස්ලිම් ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වයට ආසන්න පෙර සමයේදී නිර්මාණය කරන ලද අන්තර්ගතයන් කෙරෙහි ය. මෙම අධ්‍යයනය විසින් අන්තර්ජාලයේ වෛරී ප්‍රකාශ යන කාරණාව ද අධ්‍යයනය කරන ලදී. එය සිදු වන්නේ හා අන්තර්ජාලය හරහා පැතිරෙන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කරන ලදී. එසේම, නිර්මාණය කරනු ලබන්නේ කුමනාකාරයේ අන්තර්ගතයන් ද, කවුරුන් විසින් ද, කුමන පාඨක පිරිසකට ද යන්න ද අධ්‍යයනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 9%ක් වන මුස්ලිම් ජනයා බොහෝ අන්තර්ජාල වෛරී ප්‍රකාශවල සෘජු ඉලක්කය විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අධ්‍යයනයෙන් සොයාගන්නා ලද පරිදි, වෙනත් විවිධ කණ්ඩායම් ද ඉලක්ක වේ. ඔවුන් අතර මානව හිමිකම් ක්‍රියාකාරිකයන්, මධ්‍යස්ථ දේශපාලනඥයන්, ආගමික සංහිඳියාව වෙනුවෙන් පෙනී සිටින පූජ්‍ය පක්ෂය, කාන්තාවන්, සමලිංගික, ද්විත්ව ලිංගික සහ සංක්‍රාන්ති ලිංගික ආදී ප්‍රජාවන් සහ දැඩි මතධාරී සිංහල බෞද්ධ දේශපාලනය සමග එක්ව කටයුතු නොකරන පුරවැසියන් ද වේ.

"අවසාන වශයෙන්, සමාජ දේශපාලනික ප්‍රශ්නයක් වන මෙයට තාක්ෂණික විසඳුමක් නැත," යි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකයන් වන ශිල්පා සමරතුංග හා සංජන හත්තොටුව පෙන්වා දෙති. එමගින් අභියෝගය සාරාංශගත කෙරේ. පරිශීලකයන් සංඛ්‍යාවේ විශාලත්වය, ඉහළ මට්ටමේ අන්තර්ගතයන් ධාරිතාව හා ඒවායේ විවිධත්වය, වෛරී ප්‍රකාශ නිර්මාණය කරන වේගය සහ ඒවා බෙදාහැරෙන වේගය හේතුවෙන් තත්කාලීන නිරීක්ෂණය දුෂ්කර කාර්යයක් බවට පත් කරයි.

ඇතැම් රජයන් විසින්, වෛරී ප්‍රකාශ වැළැක්වීමේ මුවාවෙන් දේශපාලන විවේචන මර්දනය කිරීමට ගන්නා ක්‍රියාමාර්ග හේතුවෙන් අභියෝගය සංකීර්ණ වේ.

More: https://www.cpalanka.org/liking-vilence-a-study-of-hate-speech-on-facebook-in-sri-lanka/

## සිද්ධි අධ්‍යයනය 2 : අන්තර්ජාලය වසාදැමීම සහ සමාජ මාධ්‍ය වාරණය කිරීම

ස්ථාවර රැහැන් අන්තර්ජාල ජාල, ජංගම දත්ත ජාල හෝ ඒ දෙකම සම්බන්ධයෙන් සම්බන්ධතාව පිළිබඳ සිතාමතා සීමාකිරීම් පැනවීම ලෙස ජාලයන් වසාදැමීම අර්ථ නිරූපණය කෙරේ. මෑත වසරවලදී වැඩි වැඩියෙන් රටවල මෙය සිදු වී තිබේ. එමගින් පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය හා සන්නිවේදනය බරපතල ලෙස උල්ලංඝණය වේ.

බොහෝ අවස්ථාවලදී රාජ්‍ය අධිකාරීන් විසින් එවැනි සීමා කිරීම්වලට හේතු පැහැදිලි කරන්නේ නැත. දක්වා තිබෙන හේතු වර්ග කළ හැකි ය. ඒවා නම්, ජාතික ආරක්ෂාව, සාධාරණ මැතිවරණ පැවැත්වීම, විරෝධතා සහ පෙළපාලි මර්දනය සහ ප්‍රධාන පාසල් හෝ පොදු විභාගවල දී වන වංචා වැළැක්වීමයි.

අන්තර්ජාලය වසාදැමීම අන්තර්ජාල නිදහසට බාධා කරන එක්තරා ආකාරයක් ලෙස සැලකිය යුතු ය. ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කරන ජාත්‍යන්තර සංවිධානයක් වන ෆ්‍රීඩම් හවුස් (Freedom House) විසින් 2010න් පසු පසුගිය සත් වසර තුළ අන්තර්ජාල නිදහසෙහි බිඳවැටීමක් ලේඛනගත කර තිබේ. අන්තර්ජාල නිදහස නම් වන ඔවුන්ගේ වාර්ෂිකව පළ කරනු ලබන, ලොව පුරා රටවල් 65ක අන්තර්ජාල නිදහස පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනය විසින් ලෝකයේ රටවල් අතරින් 87%ක අන්තර්ජාල පරිශීලකයන් ආවරණය කරනු ලැබේ.

2018 වසරේ අන්තර්ජාල නිදහස පිළිබඳ වාර්තාව මෙසේ සටහන් කරයි: "වසාදැමීම් යනු අන්තර්ජාලයේ දුස්තොරතුරු ප්‍රචාරණයට බාධා කිරීම සඳහා ගනු ලබන අනුවණ පියවරකි. එවැනි සිද්ධිවලදී සේවාව කපාහැරීමෙන් රාජ්‍යයන් විසින් බොහෝ විට සම්පූර්ණ නගරවලට සහ පළාත්වලට සන්නිවේදන මෙවලම් වෙත ඇති ප්‍රවේශය නැති කර දමනු ලැබේ. එසේ කරනු ලබන්නේ ඒවා දැඩිව ම අවශ්‍ය වෙලාවක ය. කටකතා ප්‍රතික්ෂේප කරන්නටත්, පවුල් සාමාජිකයන් පිළිබඳ සොයාබලන්නටත්, අන්තරාදායක ප්‍රදේශ මගහරින්නටත් ඒවා අවශ්‍ය ය." අන්තර්ජාලය වසාදැමීම් සහ සීමා කිරීම් නිතර නිතර සිදු වන විට, ඒවායේ ආර්ථික සමාජයීය සහ දේශපාලන ප්‍රතිඵල ද වැඩි වේ. ඒවා විවිධ පර්යේෂණ සහ ක්‍රියාධර කණ්ඩායම් විසින් විශ්ලේෂණය කර තිබේ.

“අන්තර්ජාල වසාදැමීම්වල ගැඹුරට විහිදුණු ආර්ථිකමය, තාක්ෂණික සහ අයිතිවාසිකම් සම්බන්ධ බලපෑම් තිබේ. ඒවා මගින් අන්තර්ජාලයේ පරිශීලකයන්ගේ විශ්වාසය යටපත් කරනු ලැබේ. එමඟින් දේශීය ආර්ථිකයට පුළුල් ලෙස බලපෑම් ඇති වේ. වැදගත් අන්තර්ජාලමය රාජ්‍ය සේවාවන්ට සහ රටේ ගෞරවයට පවා එයින් හානි සිදු වේ. ප්‍රතිපත්ති සම්පාදකයන් ආරක්ෂක අවශ්‍යතා සමඟ මෙම තත්ත්වයන් ද සැලකිල්ලට ගත යුතු ය, “අන්තර්ජාල සමාජය” (ISOC) විසින් 2017 නොවැම්බර් මස ප්‍රතිපත්ති සාරාංශයකින් පැවසී ය.

2019 ජුනි දක්වා, ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය වාරණ හතරක් සිදු වී තිබේ. පළමුවැන්න සිදු වූයේ 2018 මාර්තු මස නැගෙනහිර හා මධ්‍යම පළාත්වල ඇති වූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මධ්‍යයේ ය. 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු ද රජය විසින් ප්‍රධාන සමාජ මධ්‍ය වේදිකා අවස්ථා තුනකදී සමස්තයක් ලෙස දින 16ක් වසා දැමුවේ ය. මෙම සම්බාධකවල ඵලදායිතාව පිළිබඳ පුළුල් විවාදයක් තිබේ. බොහෝ පරිශීලකයන් වර්චුවල් ප්‍රොක්සි සර්වර්ස් (virtual proxy servers) හෙවත් VPN මගින් එම වාරණය කරන ලද වේදිකා වෙත ප්‍රවේශය සලසා ගන්නා ලදී. වෛරී ප්‍රකාශ සහ දුස්තොරතුරු ප්‍රචාරයේ කැපී පෙනෙන අඩුවක් සිදු වී නැති බව දත්ත විශ්ලේෂණ මඟින් පෙන්නුම් කරන ලදී. එහෙත්, වාරණය කරනු ලැබුවේ ඒවා වැළැක්වීම සඳහා බව කියමිනි.

More at: https://freedomhouse.org/report/freedom-net/freedom-net-2018/rise-digital-authoritarianism
https://www.internetsociety.org/wp-content/uploads/2017/11/ISOC-PolicyBrief-Shutdowns-20171109-EN.pdf

## සාකච්ඡා මාතෘකා

මෙහි දැක්වෙන්නේ මෙම මාතෘකාව වැඩිදුර හැදෑරීම සඳහා ප්‍රශ්න සහ සාකච්ඡා මාතෘකා කීපයකි.

- අන්තර්ජාලය (සයිබර් අවකාශ) සහ බාහිර භෞතික අවකාශය අතර වෙනස තව දුරටත් එතරම් දැඩි එකක් නොවේ. මේ දෙක සමපාත වීමේ හාකියාව වැඩි ය. ඩිජිටල් තාක්ෂණයන් සහ අන්තර්ජාලය භාවිතා කිරීම සම්බන්ධ ඔබගේ අත්දැකීම් පාදක කරගෙන මේ පිළිබඳ සාකච්ඡා කරන්න.

- පෞද්ගලිකත්වය ආවරණය කරන 12 වගන්තියට සහ අදහස් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස ආවරණය කරන 19 වගන්තියට විශේෂ අවධානය යොමු කරමින් විශ්ව මානව හිමිකම් ප්‍රකාශය සාකච්ඡා කරන්න.

- ප්‍රකාශනයේ නිදහස ඇතැම් පුද්ගලයන් කම්පනයට, වැරදිකාරීත්වයට, කලබලයට පත් කරන ජනප්‍රිය නොවන මත සහ අදහස් දක්වා ද ප්‍රකාශනයේ නිදහස විහිදේ. ඔබ මෙයට එකඟ ද?

- අන්තර්ජාලයේ වෛරී ප්‍රකාශ පිටුදැකීමෙහි ලා මතු වන ප්‍රධාන අභියෝග මොනවා ද?දේශපාලකයන් සහ ආණ්ඩු විවේචනය කිරීම වෛරී ප්‍රකාශ ස්වරූපයක් ද? සාකච්ඡා කරන්න.

- ඩිජිටල් පෞද්ගලිකත්වය, පරීක්ෂාවට ලක් වීම සහ එන්ක්‍රිප්ට් කිරීම (encryption) එකිනෙකට සම්බන්ධ ද? අන්තර්ජාලය තුළ පරම පෞද්ගලිකත්වයක් නැති හෙයින් සෑම පරිශීලකයකුට ම හැකි තරම් දුරට ඩිජිටල් පෞද්ගලිකත්වය ආරක්ෂා කරගැනීම සඳහා ගත හැකි ප්‍රායෝගික ආරක්ෂණයන් මොනවා ද?

- අන්තර්ජාලයේ ස්ත්‍රීවාදී මූලධර්ම 17 හදාරන්න. සුරක්ෂිත, වඩා වගකීම් සහගත සහ ඵලදායී වෙබ් භාවිතාවක් සෑමට තහවුරු කිරීමට එය දායක වන්නේ කෙසේදැයි හඳුනාගන්න.

- 'අන්තර්ජාලයේ නිදහසී යනු ලොව පුරා ඒ පිළිබඳව කරනු ලබන වාර්ෂික අධ්‍යයනයකි. එය ඉදිරිපත් කරනු ලබන්නේ එක්සත් ජනපද ක්‍රියාධර කණ්ඩායමක් වන ෆ්‍රීඩම් හවුස් විසිනි. අන්තර්ජාලයේ නිදහස පිළිබඳ අලුත් ම වාර්තාව අධ්‍යයනය කර ඔබගේ රට සම්බන්ධයෙන් කරනු ලබන තක්සේරුවට ඔබ එකඟ වනවා ද යන්න සාකච්ඡා කරන්න. https://freedomhouse.org/report-types/freedom-net

- ශ්‍රී ලංකාව ඇතුළු රජයන් සමස්ත අන්තර්ජාල වසා දැමීම් හෝ සමාජ මාධ්‍ය සහ/ හෝ වැට් යෙදුම් තෝරාගෙන ජාතික ආරක්ෂාව, නීතියේ හා සාමය, සාධාරණ මැතිවරණ ආදි පදනම් මත වාරණය කිරීම් සිදු කරති. එවැනි වෙනස්කම් රහිත වාරණය කිරීම් කිසියම් තත්වයක් තුළ සාධාරණීකරණය කළ හැකි ද? සාකච්ඡා කරන්න.

## ඉගෙනුම් ප්‍රතිඵල

මෙම මොඩියුලය අවසානයේදී ඔබට පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අවබෝධයක් ලැබී තිබේ.

- සෑම ඩිජිටල් හිමිකමක් ම සයිබර් අවකාශයේදී මානව හිමිකම් ය. මෙම හිමිකම් ප්‍රවර්ධනය කිරීම භෞතික ලෝකයේ සිදුවන දේ සමග සමීපව සම්බන්ධ ය.
- ඇතැම් මානව හිමිකම් සයිබර් අවකාශයට විශේෂයෙන් අදාළ ය. ඒ අතරට ප්‍රකාශනයේ නිදහස, දත්ත ආරක්ෂා කරගැනීමේ සහ පෞද්ගලිකත්වයේ නිදහස සහ සංවිධානය වීමේ නිදහස අයත් වේ.
- මෑත වසරවලදී අන්තර්ජාලය වෙත මූලික පිවිසුම වේගයෙන් වර්ධනය වී තිබේ. (වසර 2018 වන විට මානව වර්ගයාගෙන් අඩක් පමණ එය භාවිතා කරති). සෙසු පිරිස සම්බන්ධ කරගැනීම වැදගත් අරමුණකි.
- ඩිජිටල් සහ වෙබ් මෙවලම් යනු දෙපැත්ත කැපෙන කිණිස්සක් වැනි ය. එමඟින් මානව හිමිකම් සපුරාගැනීම ඇති කළ හැකිවා මෙන් ම, අන්තර්ගතයන් වාරණය කිරීමෙන් සහ අන්තර්ජාලය සම්පූර්ණයෙන් වසාදැමීමෙන් හෝ පරීක්ෂාවට ලක් කිරීම මඟින් ප්‍රකාශනයට බාධා පැමිණවීමෙන් තොරතුරු වෙත ප්‍රවේශය වැළැක්වීමට ද එයට පුළුවන.
- වෛරී ප්‍රකාශ බාහිර භෞතික අවකාශයේ මෙන් ම අන්තර්ජාලයේ ද තිබේ. සමාජයන් ඒ දෙකම සම්බන්ධයෙන් එකම අකාරයෙන් ම ප්‍රතිචාර දැක්විය යුතු යː සත්‍ය වශයෙන් ලෝකයට හානි කළ හැකි ප්‍රකාශනවලට ප්‍රතිචාර දක්වන ගමන් නීත්‍යානුකූල විවේචනයට ඉඩ දිය යුතු ය.
- වෛරී ප්‍රකාශවලට එරෙහි නීති අවශ්‍ය ය. එහෙත්, ඒවා ප්‍රමාණවත් නැත. පුරවැසි අධ්‍යාපනය, ඩිජිටල් සාක්ෂරතාව වර්ධනය කිරීම සහ සංවාදයේ යෙදීම සඳහා අන්තර්ජාල සමාජයේ හැකියාවන් ශක්තිමත් කිරීම නීතිමය නොවන මූලෝපායන් අතර තිබේ.
- අන්තර්ජාලය නිර්මාණය කරනු ලැබුවේ විවෘත ගෝලීය වේදිකාවක් ලෙස ය. එහි සැලැස්ම විසින් ම එය කිසිදු රජයකට පාලනය කළ නොහැකි අවකාශයක් බවට පත් කර තිබේ. එහෙත්, ඇතැම් රජයන් තම රට තුළ අන්තර්ගතයන් පෙරහන් කිරීමට සහ වාරණය කිරීමට ක්‍රමෝපායන් සකසාගෙන තිබේ.
- සිවිල් සමාජ කණ්ඩායම් විසින් ගෝලීය අන්තර්ජාලය වඩා අන්තර්ග්‍රහණය කරගන්නාසුළු, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී, සහභාගී සහ ආරක්ෂිත අවකාශයක් බවට පත්කිරීම සඳහා අදහස් නායකත්වය සපයා තිබේ. පසුගිය කාලය තුළ, අන්තර්ජාල හිමිකම් ප්‍රඥප්තිය, අන්තර්ජාලය පිළිබඳ ස්ත්‍රීවාදී මූලධර්ම සහ වෙනත් වැදගත් ලේඛන මගින් මේ සඳහා ක්‍රියාකාරී දායකත්වය දක්වා තිබේ.

## වැඩිදුර කියවීම්

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අදහස් දැරීමේ හා ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කිරීම පිළිබඳ විශේෂ මැදිහත්කරු
https://www.ohchr.org/en/issues/freedomopinion/pages/opinionindex.aspx

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ පෞද්ගලිකත්වයේ හිමිකම පිළිබඳ විශේෂ මැදිහත්කරු
https://www.ohchr.org/EN/Issues/Privacy/SR/Pages/SRPrivacyIndex.aspx

අන්තර්ජාලයේ නිදහස: ලොව පුරා අන්තර්ජාල නිදහස පිළිබඳ වාර්ෂික අධ්‍යයනයන්
https://freedomhouse.org/report-types/freedom-net

2017 ගෝලීය අන්තර්ජාල වාර්තාව: අපගේ ඩිජිටල් අනාගතය දෙසට මග. අන්තර්ජාල සමාජය, 2017.
https://www.internetsociety.org/globalinternetreport/

ප්‍රගාමී සන්නිවේදනය සඳහා සංගමය (APC)
https://www.apc.org/

ප්‍රචණ්ඩත්වයට කැමැත්ත දැක්වීම: ශ්‍රී ලංකාවේ ෆේස්බුක්හි වෛරී ප්‍රකාශ සම්බන්ධ අධ්‍යයනයක්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2014
https://www.cpalanka.org/liking-violence-a-study-of-hate-speech-on-facebook-in-sri-lanka/

Article 19 (ප්‍රකාශනයේ නිදහස පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමක්) ඩිජිටල් හිමිකම් සංරක්ෂණාගාරය:
https://www.article19.org/issue/digital-rights/

Electronic Frontier Foundation (EFF)
https://www.eff.org/

යුරෝපා කවුන්සිලයේ ප්‍රකාශනයේ නිදහස වෙබ් අඩවිය
https://www.coe.int/en/web/freedom-expression/internet-freedom1

එකම කාසියේ දෙපැත්ත - පෞද්ගලිකත්වය සහ ප්‍රකාශනයේ නිදහස
Privacy International විසින් අධ්‍යයනයක්
https://privacyinternational.org/blog/1111/two-sides-same-coin-right-privacy-and-freedom-expression

## වැඩිදුර මූලාශ්‍ර

**EROTICS:** ලිංගිකත්වය සහ අන්තර්ජාලය අතර සම්බන්ධය පිළිබඳ කටයුතු කරන ක්‍රියාකාරිකයක්ගේ සහ පර්යේෂකයන්ගේ අන්තර්ජාල ජාලයක්
https://erotics.apc.org/

**Gender and Internet Governance eXchange:** අන්තර්ජල පාලනයේ ප්‍රතිපත්ති ක්‍රියාවලිය සහ සංවර්ධනය සම්බන්ධයෙන් කාන්තා සහභාගිත්වයේ හිමිකම් සහ ලිංගික හිමිකම් අතර පරතරය සම්බන්ධයෙන් කටයුතු කිරීම
http://gigx.events.apc.org/en/home-page/

**Gender Evaluation Methodology:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සිතමින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇගයීම
http://www.genderevaluation.net/

**GenderIT.org:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ තාක්ෂණික ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමුකරන ලොව පළමු වෙබ් අඩවිය
https://www.genderit.org/

**Take Back the Tech!** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සඳහා තාක්ෂණය පාලනය කිරීමේ ඉල්ලීමක්
https://www.takebackthetech.net/

